**දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය**
**කොළඹ විශ්වවිද්‍යාලය**
உண்ணாட்டு மருத்துவக் கல்வி நிறுவகம்
கொழும்புப் பல்கலைக்கழகம்
**Institute of Indigenous Medicine**
University of Colombo

**රාජගිරිය, ශ්‍රී ලංකාව**
ராஜகிரிய, இலங்கை
Rajagiriya, Sri Lanka
**දුරකථන අංක:** +94 112694308
Telephone No: +94 112692385

මගේ අංකය - IIM/SW/03

දිනය - 2021.01.06

2013/2014 අධ්‍යයන කණ්ඩායම
දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය

<u>අවසන් වසර පළමු හා දෙවන සමාසික ලිඛිත විභාගය සම්බන්ධයෙනි</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ විසින් යොමුකරන ලද 2021.01.05 දිනැති ලිපිය හා බැඳේ.

දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ අවසන් වසර ඉගෙනුම ලබන 2013/2014 අධ්‍යයන කණ්ඩායම සඳහා 2020.12.15 දිනැතිව පැවැත්වීමට නියමිතව තිබූ අවසන් වසර පළමු සමාසික ලිඛිත පරීක්ෂණය 2021.01.18 දින දක්වා කල් දැමීමේදී රටතුළ එවකට පැවති කොරෝනා වෛරස ව්‍යාප්ති තත්වය කෙරෙහි දැඩි අවධානයක් යොමුකරන ලදී.

කෙසේනමුත් කොරෝනා වෛරස ව්‍යාප්තියේ අනාගත තත්වය පිළිබඳව ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ඉදිරිපත් කර ඇති පුරෝකථන වලට අනුව මෙම අවධානම්කාරී තත්වය තවත් වසරක් හෝ ඊට වැඩිකාලයක් දක්වා දීර්ඝ විය හැකි බැවින් අවසන් වසර සිසුන්ගේ සියලුම ලිඛිත පරීක්ෂණ පළමුව සියලු සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේදයන්ට අනුව සිදුකිරීමට ආයුර්වේද ආංශීය කමිටුව විසින් ඒකමතිකව අද දින (2021.01.06) තීරණය කරන ලදී.

ඒ අනුව අදාළ සියළුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේදවලට අනුගතව හා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ උපදෙස් යටතේ අවසන් වසර ලිඛිත පරීක්ෂණ කටයුතු පැවැත්වීම සඳහා ආයතනය විසින් අවශ්‍ය සෑම ක්‍රියාමාර්ගයක්ම මේ වනවිටත් සැලසුම් කර තිබේ.

පළමු පෙළ ආශ්‍රිතයින් ලෙස නිවෙස්වල ස්වයං නිරෝධායනයවන සිසුන් අදාළ විභාග පවත්වන කාල සීමාව තුළ සිටියහොත් එම සිසුන්ට විශේෂ ක්‍රමවේදයක් ඔස්සේ විභාග කටයුතු පැවැත්වීමට අප ආචාර්ය මණ්ඩලය මේ වන විටද කටයුතු කර ඇති බැවින් එම සිසුන් අදාළ අවස්ථාවන්හිදී සහකාර ලේඛකාධිකාරී/ ශිෂ්‍ය සේවා වෙත 0112888212 යන දුරකථන අංකය ඔස්සේ දන්වන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ප්‍රියානි ඒ. පරණගම
අධ්‍යක්ෂ

Director
2861399
2697175
Fax: 2697175
E-mail:director@iim.cmb.ac.lk

Deputy Registrar
2697772
Fax: 2697772

Deputy Bursar
2689153
Fax: 2689153

Senior Assistant Registrar
5679709

Assistant Registrar
2687063